**වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය - 2023**

**----------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාව, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 50 ඡේදය අනුව වත්කම් නිවැරදි ලෙස කාණ්ඩගත කිරීමෙන් තොරව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ රු.4,532,897 ක් වූ වත්කම් අනිකුත් වත්කම් ලෙස දක්වා තිබුණි. | අනෙකුත් වත්කම් ලෙස දක්වා ඇත්තේ, වර්ගීකරණය කරන ලද ස්ථාවර වත්කම් කාණ්ඩවලට ඇතුළත් කළ නොහැකි වත්කම් වන අතර 2024 මූල්‍ය ප්‍රකාශනවල මෙය නැවත වර්ගීකරණය කිරීමට කටයුතු කරනු ලබන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව කටයුතු කළ යුතුය. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බහුකාර්ය ශබ්දාගාර සංකීර්ණය සඳහා 2017 සහ 2018 වර්ෂවලදී මිලදීගෙන තිබූ රු. 60,498,450 ක් වටිනාකමැති උපකරණ ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කිරීමකින් තොරව මූල්‍ය ප්‍රකාශන තුල කෙරීගෙන යන වැඩ වශයෙන් දක්වා තිබූ අතර ඒ සඳහා ක්ෂය ගැලපීම් සිදුකිරීමට ක්ෂය ප්‍රතිපත්තියක් හඳුනාගෙන නොතිබුණි. | බහුකාර්ය ශබ්දාගාරයෙන් අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය වන උපකරණ වලින් කොටසක් රු.මිලියන 60.5 කට මිලදී ගෙන ඇති අතර මෙම උපකරණ දැනට භාවිතා කිරීමට හැකියාවක් නොමැති බව | පිළිතුර පිළිගත නොහැකි අතර එම උපකරණ භාවිතා කරන බව සනාථ වී ඇති බැවින් ගිණුම්කරණ දෝෂ නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ අස්පෘශ්‍ය වත්කම් (මෘදුකාංග) වලට අදාළ ක්‍රමක්ෂය ලෙස රු. 1,327,606 ක් දක්වා තිබුණද ඊට අදාල ක්ෂය ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශන තුල හෙළිදරව් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන තුල අස්පෘෂ්‍ය වත්කම් සටහනේ ක්ෂය ප්‍රතිශතය ඇතුළත් කර නොමැති අතර 2024 මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් කිරීමට කටයුතු කරනු ලබන බව | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අදාළ වන සියළුම ප්‍රතිපත්ති හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.60,583,178 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.57,072,162 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,511,013 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට මෙහෙයුම් වියදම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විශ්වවිද්‍යාලය විසින් පවත්වාගෙන යනු ලබන විභාගයන්හි ප්‍රතිඵල මාස 03 ක් ඇතුළත විභාග අංශයට භාරදිය යුතු වන බව සහ විභාග අංශය වෙත ප්‍රතිඵල ලද දින සිට මාසයක් ඇතුළත ප්‍රතිඵල නිකුත් කළ යුතු බව 2022 දෙසැම්බර් 29 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී තීරණය කර තිබුණද 2022/2023 වර්ෂයේ පවත්වන ලද විභාග 09 ක ප්‍රතිඵල නිකුත් කිරීමට මාස 06 ක කාලයක් ගත වී තිබුණි. | ඇතැම් බාහිර කථිකාචාර්යවරුන් විසින් ලකුණු භාරදීම ප්‍රමාදවීම හා අභ්‍යන්තර කාර්යය මණ්ඩල හිඟය හේතුවෙන් විභාග ප්‍රතිඵල නිකුත් කිරීම ප්‍රමාදවී ඇති බව. | නියමිත කාලය තුළදී ප්‍රථිපල නිකුත් කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විශ්වවිද්‍යාලය මගින් පවත්වාගෙන යනු ලබන ඉංජිනේරු උපාධි පාඨමාලා සඳහා ප්‍රතීතනය ලබා ගැනීමට 2010 මැයි 18 දින පැවති රැස්වීමේදී තීරණය කර තිබුණද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලය පිහිටුවා වසර 10 ට වැඩි කාලයක් ගත වී ඇතත් අපේක්ෂිත මට්ටමට උපාධි පාඨමාලාවල තත්ත්ව සහතික කිරීමට නොහැකිවීම හේතුවෙන් ප්‍රතීතනය ලබාගැනීමට නොහැකි වී තිබුණි. | ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් 2022 වර්ෂයේ මැදභාගයේදී නව ප්‍රතීතන අත්පොතක් නිකුත් කිරීම හේතුවෙන් හා එම අත්පොතට අදාළව අවම වශයෙන් එක් අධ්‍යයන දෙපාර්තමේතුවක් තුල රාජකාරියේ යෙදිය යුතු වන අවම ස්ථිර කාර්යමණ්ඩල සංඛ්‍යාව 8 ක් වශයෙන් දක්වා ඇතත්, එම අවශ්‍යතාවය මෙම විශ්වවිද්‍යාලය විසින් සපුරා නොමැති විම හේතුවෙන් ප්‍රතීතන ක්‍රියාවලිය නතර කර නැවත ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ නිලධාරීන් සමඟ සාකච්ඡා කරමින් සිටින බව. | උපාධි පාඨමාලා සඳහා ප්‍රතීතනය කිරීමට අවශ්‍යය කටයුතු කඩිනමින් සිදු කළ යුතුය. |

## 3.3 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2017 ජනවාරි 03 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව රු. මිලියන 927.34 ක ඇස්තමේන්තුවක් මත විශ්වවිද්‍යාලය සඳහා වැඩහලක්, සිසුන් 600 ක් සඳහා නේවාසිකාගාරයක් සහ ආසන 300 කින් යුතු ආපන ශාලාවක් ඉදිකිරීමට අනුමැතිය ලබාදී තිබුණි. 2018, 2019 හා 2020 වර්ෂයන්හිදී මෙම ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 281.36 ක් වෙන්කර තිබුණු අතර ඉන් රු. මිලියන 22.5 ක් පමණක් උපදේශන ගාස්තු ලෙස ගෙවා තිබුණි. ඉහළ කළමනාකාරීත්වය විසින් නිසි කාලය තුළ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට ක්‍රියා නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විට එහි වියදම් ඇස්තමේන්තුව රු. මිලියන 3,046.8 ක් දක්වා එනම් සියයට 300 කින් වැඩි වී තිබුණි. | අමාත්‍යාංශය මඟින් වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය වෙත එවා ඇති 2022 මැයි 04 දිනැති ලිපියට අනුව අදාල ව්‍යාපෘතිය තාවකාලිකව අත්හිටුවීමට පියවර ගත්තද නැවත වරක් 2024 මූල්‍ය වර්ෂය සඳහා මුදල් ප්‍රතිපාදන භාණ්ඩාගාරයෙන් ඉල්ලා සිටිය ද ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් ගොඩනැඟිලි ඉදිකිරීම් සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් නොකිරීමට රජය තීරණය කර ඇති බව දන්වන ලද බව. | ඉදිකිරීමට අපේක්ෂිත ගොඩනැගිල්ල පිළිබඳ අදාළ නිලධාරින් දැනුවත් කර අවශ්‍යය මූල්‍ය පහසුකම් ලබාගෙන ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ බහුකාර්ය ශබ්දාගාර සංකීර්ණයක් හා දේශනශාලා සංකීර්ණයක් සහිත ගොඩනැගිල්ලක් ඉදිකිරීමට 2011 අප්‍රේල් 27 දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී තිබූ අතර ඒ සඳහා රු. මිලියන 434.4 ක් භාණ්ඩාගාරයෙන් හා ආංශික නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය මඟින් වෙන්කර තිබුණි. 2020 දෙසැම්බර් 31 දින වන විට ඉන් රු. මිලියන 304.5 ක් වියදම් කර තිබුණ නමුත් එම ගොඩනැඟිල්ල ප්‍රයෝජනයට ගැනීමට හැකි වී නොතිබුණි. | මෙම ගොඩනැගිල්ලෙහි පැවති අඩුපාඩු හා ශබ්දාගාරයට අදාළ වන වායුසමීකරණ පද්ධතියේ වූ අඩුපාඩු බොහෝ දුරට සම්පූර්ණ කර ඇති අතර වායුසමීකරණ පද්ධතිය විධිමත් ආකාරයට මෙම විශ්වවිද්‍යාලය වෙත භාරදුන් පසුව අදාල ආයතනය සමඟ සේවා හා නඩත්තු ගිවිසුමකට එලඹීමට නියමිත බව. | අයවැය ප්‍රතිපාදන සලසාගෙන ප්‍රමාදයකින් තොරව ව්‍යාපෘතියේ ඉතිරි වැඩ අවසන් කිරීමට කටයුතු කළ යුතුය. |